**ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.**

**පළමු වාර පරීක්ෂණය - 2016**

**12 ශ්‍රේණිය**

**ඉතිහාසය**

## I කොටස

- අංක 1 සිට 10 දක්වා ප්‍රශ්න වලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් ඇත. ඒවා අතුරින් එකක් පමණක් කවර හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි. හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.

01) 1) බූර්බොන් 2) ඔරෙන්ජ් 3) හැප්ස්බර්ග්
4) ස්ටුවට් 5) කයිසර්
(.............)

02) 1) ජල රාමුව 2) ගුරුත්වා කර්ෂණය 3) දුවන නාඩාව
4) ජෙනි යන්ත්‍රය 5) වාෂ්ප එංජිම
(.............)

03) 1) පැරිස් 2) කේම්බ්‍රිජ් 3) බොලොඤ්ඤ
4) ඔක්ෆර්ඩ් 5) නාලන්දා
(.............)

04) 1) කලම්බස් 2) වෙස්පුචි ඇමරිගො 3) වස්කෝද ගාමා
4) ගැලිලියෝ ගැලලි 5) පර්ඩිනන්ඩ් මැගලන්
(.............)

05) 1) බොහිමියන් අවධිය 2) ඩෙන්මාර්ක් අවධිය 3) ස්විඩන් අවධිය
4) ඉතාලි අවධිය 5) ප්‍රංශ අවධිය
(.............)

06) 1) තෙම්ස් 2) රයින් 3) සෙන්
4) ඩැනියුබ් 5) කැස්පියන්
(.............)

07) 1) බ්‍රසීලය 2) පිරූ 3) මෙක්සිකොව
4) රියොද ජනයිරෝ 5) කැලිකට්
(.............)

08) 1) මාර්ටින් ලූතර් 2) ජෝන් කැල්වින් 3) උල් රිච් ස්විග්ලි
4) ජොන්හස් 5) විලියම් හාවේ
(.............)

09) 1) ඉන්කාවරු 2) මයාවරු 3) ඇස්ටෙක් වරු
4) රතු ඉන්දියන්වරු 5) ලේප්වාවරු

(.............)

10) 1) ඩෙම් ලර් 2) ජොන් ස්ටීවන්සන් 3) රයිට් සහෝදරයෝ
4) රොබට් ජුල්ටන් 5) මාර්කෝනි

(.............)

■ අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්න සඳහා පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතරින් එක යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම නොගැලපෙන පද යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාල අංකය තිත් ඉර මත ලියන්න.

11) 1) වස්කෝද ගාමා - ඉන්දියාවට යාත්‍රා කිරීම.
2) බර්තෝලමියු ඩයස් - අප්‍රිකා මහාද්වීපයේ කුනාටු තුඩුව
3) ක්‍රිස්ටෝපර් කලම්බස් - බටහිර ඉන්දිය දූපත්
4) ෆර්ඩිනල් මැගලන් - ලෝකය වටා ගමන් කිරීම
5) කබ්රාල් - මෙක්සිකෝව

(.............)

12) 1) වොල්ගා - ගඟ කි.
2) කිල් - ඇළ කි.
3) කෝසිකෝව - දූපත කි.
4) කළු - මුහුද කි.
5) සෙන් - සමුද්‍ර සන්ධිය කි.

(.............)

13) 1) උත්කෘෂ්ට විප්ලවය - 1688
2) ප්‍රංශ විප්ලවය - 1789
3) ජර්මනිය එක්සත් කිරීම - 1866
4) ඇමරිකානු නිදහස් සටන - 1776
5) රුසියන් විප්ලවය - 1917

(.............)

14) 1) වස්කෝද ගාමා - දේශ ගවේෂයකි.
2) ලියනාඩො ඩාවින්චි - චිත්‍ර ශිල්පියෙකි.
3) තෝමස් මුවර් - ගත් කතුවරයෙකි.
4) වින්සන් චර්චිල් - ගෘහ නිර්මාණ ශිල්පියෙකි.
5) ඇරිස්ටොටල් - දාර්ශනිකයෙකි.

(.............)

15) 1) ලන්ඩන් - නගරය කි.
2) මධ්‍ය ධර්නි - මුහුද කි.
3) සිසිලි - දූපත කි.
4) රෝමය - රටා වේ.
5) සුවස් - ඇල කි.

(.............)

අංක 16 සිට 25 දක්වා එක් එක් ප්‍රශ්නයක් සඳහා නාම/ ප්‍රකාශන/ දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන/ දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයට ගැලපේ. එහෙත් එවා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙලට නොවේ Y තීරුවේ X තීරුව සමග ගැලපෙන අනුපිළිවෙලට සකස් කල විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා තිත් ඉර මත ලියන්න.

16)

| | X | | Y |
|---|---|---|---|
| 1) | ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය | A) | පැසිපික් සාගරය හා අත්ලාන්තික් සාගරය |
| 2) | ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය | B) | උතුරු මුහුද හා බෝල්ටික් මුහුද |
| 3) | සූවස් ඇළ | C) | අත්ලාන්තික් සාගරය සහ මධ්‍යධරණී මුහුද |
| 4) | පැනමා ඇළකි. | D) | ඊජියන් මුහුද සහ මර්මරා මුහුද |
| 5) | කිල් ඇළ | E) | මධ්‍යධරණී මුහුද සහ රතු මුහුද |

1) DECBA 2) DCEAB 3) DABCE
4) DBAEC 5) DEBAC

(.............)

17)

| | X | | Y |
|---|---|---|---|
| 1) | වැඩවසම් ක්‍රමය | A) | වාණිජ වාදය |
| 2) | ජාතික රාජ්‍ය | B) | යටත් විජිත |
| 3) | අධිරාජ්‍ය | C) | පෞද්ගලික ව්‍යවසාය |
| 4) | ධනවාදය | D) | ප්‍රවේණිය |
| 5) | කම්කරු පන්ති ව්‍යාපාරය | E) | වෘත්තීය සමිති |

1) DECBA 2) DCEAB 3) DABCE
4) DBAEC 5) DEBAC

(.............)

18)

| | X | | Y |
|---|---|---|---|
| 1) | මාර්ක්විටේ | A) | ස්පාඤ්ඤය |
| 2) | ජොන් කැබෝ | B) | පෘතුගාලය |
| 3) | කබ්රාල් | C) | නෙදර්ලන්තය |
| 4) | කොලම්බස් | D) | ප්‍රංශය |
| 5) | හඩ්සන් | E) | එංගලන්තය |

1) DECBA 2) DCEAB 3) DABCE 4) DBAEC 5) DEBAC

(.............)

19)

| | X | | Y |
|---|---|---|---|
| 1) | තෝමස් නිව් කෝමන් | A) | ගුවන් විදුලිය |
| 2) | ජෝර්ජ් ස්ටිවන්සන් | B) | දුරකථනය |
| 3) | විලියම් ගිල්බට් | C) | දුම්රිය |
| 4) | මාර්කොනි | D) | වාෂ්ප එන්ජිම |
| 5) | ග්‍රැහැම්බෙල් | E) | විදුලිය |

1) DECBA 2) DCEAB 3) DABCE 4) DBAEC 5) DEBAC

(.............)

20) X — Y

| | X | | Y |
|---|---|---|---|
| 1) | රුමේනියාව | A) | බර්ලින් |
| 2) | ජර්මනිය | B) | වියානා |
| 3) | ඔස්ට්‍රියාව | C) | බෙල්ග්‍රේඩ් |
| 4) | යුගොස්ලාවියාව | D) | බුකරෙස්ට් |
| 5) | ස්පාඤ්ඤය | E) | මැඩ්රිඩ් |

1) DECBA 2) DCEAB 3) DABCE 4) DBAEC 5) DEBAC

(.............)

21) X — Y

| | X | | Y |
|---|---|---|---|
| 1) | කොපර් නිකස් | A) | සාපෙක්ෂතාවාදි |
| 2) | ගැලිලියෝ ගැලලි | B) | ගුරුත්වාකර්ෂණ නියාමය |
| 3) | විලියම් හාවේ | C) | රුධිරය සංසරණය වන ආකාරය |
| 4) | අයිසැක් නිව්ටන් | D) | සූර්ය කේන්ද්‍රිය විශ්වය පිළිබඳ |
| 5) | ඇල්බට්න්ස්ටයින් | E) | දුරදක්නය නිපදවීම |

1) DECBA 2) DCEAB 3) DABCE 4) DBAEC 5) DEBAC

(.............)

22) X — Y

| | X | | Y |
|---|---|---|---|
| 1) | මැකියාවලි | A) | ජාතින්ගේ ධනය |
| 2) | මොන්ටේස්කියු | B) | සමාජ සම්මුතිය |
| 3) | ඇඩම් ස්මිත් | C) | කුමාරයා |
| 4) | රූසෝ | D) | දාස් කැපිටාල් |
| 5) | කාල්මාක්ස් | E) | නීතියේ සාරය |

1) CABDE 2) CEABD 3) CBDEA 4) CDEAB 5) CABDE

(.............)

23) X — Y

| | X | | Y |
|---|---|---|---|
| 1) | 1688 උත්කෘෂ්ට විප්ලවය | A) | පාර්ලිමේන්තුවේ අනුමැතිය නැතිව බදු පැන වීමට රජුට බැරිය. |
| 2) | ඇමරිකානු විප්ලවය | B) | නිදහස, සමානාත්වතාව, සහෝදරත්වය |
| 3) | ප්‍රංශ විප්ලවය | C) | නියෝජිතයින් නැති නම් බදුත් නැත. |
| 4) | කාර්මික විප්ලවය | D) | නිර්ධන පංතියේ ජයග්‍රහනය |
| 5) | බොල්ෂෙවික් විප්ලවය | E) | නව අධිරාජ්‍ය වාදයට මග පෑදීම. |

1) ABCDE 2) ACDEB 3) ACBED 4) AEBCD 5) ADECB

(.............)

24) X — Y

| | X | | Y |
|---|---|---|---|
| 1) | ඉංග්‍රීසි | A) | පැසිපික් සාගරය හා අත්ලාන්තික් සාගරය |
| 2) | ස්පාඤ්ඤ | B) | උතුරු මුහුද හා බොල්ටික් මුහුද |
| 3) | පෘතුගාලය | C) | මෙක්සිකොව |
| 4) | ප්‍රංශ | D) | ක්විබෙක් |
| 5) | ඕලන්ද | E) | වර්ජිනියා |

1) EBDAC 2) EDACBB 3) EACBD 4) ECADB 5) ECBDA

(.............)

25)

| | X | | Y |
|---|---|---|---|
| 1) | වොල්ගා ගඟ | A) | ඉංග්‍රිසි ඕඩය |
| 2) | තේම්ස් ගඟ | B) | බෝල්ටික් මුහුද |
| 3) | විස්ටියුලා ගඟ | C) | උතුරු මුහුද |
| 4) | රයින් ගඟ | D) | ඇඩ්‍රියාතික් මුහුද |
| 5) | පෝ ගඟ | E) | කැස්පියන් මුහුද |

1) EABCD 2) EACDB 3) EADBC 4) EABDC 5) EACBD

(.............)

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C, D, සහ E යන ප්‍රතිචාර පහ අතුරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා
  - A සහ B පමණක් නිවැරදි නම් .................................... 1 ද,
  - B සහ C පමණක් නිවැරදි නම් .................................... 2 ද,
  - C සහ D පමණක් නිවැරදි නම් .................................... 3 ද,
  - A සහ C පමණක් නිවැරදි නම් .................................... 4 ද,

  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් අංක 5 ද තිත් ඉර මත ලියන්න.

26) පහත දැක්වෙන ඒවා අතුරින් යුරෝපය මධ්‍යගත යුගය සිට නූතන යුගයට පරිවර්තනය වීම සලකුණු කරන වර්ධනයන් කවරේද?

A) බලය විකේන්ද්‍රනය වූ රාජාණ්ඩුව

B) එක්සත් යුරෝපීය ක්‍රිස්තු සභාව

C) වාණිජ ධනවාදයේ නැගීම

D) දේශ ගවේෂණය

(.............)

27) පහත දැක්වෙන කරුණු අතුරින් තිස් අවුරුදු යුද්ධය ඇතිවීමට තුඩුදුන් සාධක කවරේද?

A) ජර්මනියේ පැවැති ආගමික මතභේද

B) ඔග්ස්බර්ග් සාම ගිවිසුමේ අඩුපාඩු

C) ශුද්ධ රෝම අධිරාජයා සහ ජර්මන් කුමාරවරුන් අතර පැවැති දේශපාලන ගැටුම්

D) දෙවන පිලිප්, ශුද්ධ රෝම අධිරාජයා ලෙස ඔටුනු පැළඳවීම.

(.............)

28) පහත දැක්වෙන පනත් අතුරෙන් එංගලන්ත පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය වීම හා සම්බන්ධ ඒවා කවරේද?

A) 1689 අයිතිවාසිකම් පිළිබඳ පනත

B) 1928 සර්ව ජන ඡන්ද බලය ප්‍රධානය කිරීම.

C) 1735 එංගලන්තයේ කැබිනට් ක්‍රමය හඳුන්වා දීමේ පනත

D) 1767 ටවුන් සෙන්ඩ්ගේ ආදායම් බදු පනත්

(.............)

29) පහත දැක්වෙන කරුනු අතරින් ඉතාලියේ පුනරෝධය ඇතිවීමට තුඩුදුන් සාධක කවරේද?

A) සම්භාව්‍ය රෝම ශිෂ්ටාචාරයේ බලපෑම ඉතාලිය තුළ නොනැසී පැවැත්ම

B) කොන්ස්තන්තිනොපලයේ සිට ඉතාලියට ග්‍රීක - රෝම දැනුම ගලා ඒම.

C) ඉතාලියේ ආර්ථික සංවර්ධනය

D) ආගමික ප්‍රතිසංස්කරනයේ බලපෑම

(.............)

30) පහත දැක්වෙන කරුනු අතරින් වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ කවරේද?

A) ආගමික ප්‍රතිසංස්කරණ

B) ඒකාධිපති රාජාණ්ඩු

C) ස්වැංපොසිත භාවය

D) බලය විකේන්ද්‍රනය

(.............)

- අංක 31 සිට 35 තෙක් සැම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුන තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.

31) 1) ආගමික ප්‍රතිසංස්කරණය ජර්මනියේ ආරම්භ විය.

2) එහි නායකයා වුයේ මාටින් ලුතර් ය.

3) ආගමික ප්‍රතිසංස්කරණ ඇතිවීමට තුඩු දුන් ආසන්නම හේතුවුයේ පුණ්‍ය එල පත්‍රිකා විකිණීමට හේතු කොටගෙන ඇති මත බෙද යයි.

4) ස්විට්සර්ලන්තයේ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ වැදගත්ම නායකයා වුයේ ජොන් කැල්වින් ය.

5) පාප් වහන්සේ මෙම ව්‍යාපාරයට අනුග්‍රහය දැක්විය.

(.............)

32) ජාතික රාජ්‍ය,

1) බලය රජුවෙත සංකේන්ද්‍රගත කරන ලද ශක්තිමත් රාජාණ්ඩුව

2) බලවත් වැඩවසම් රදළ පංතිය

3) ශක්තිමත් ස්ථාවර හමුදාව

4) වෙළෙදාමේ ව්‍යාප්තියට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.

5) රජවරුන් විසින් මධ්‍යම පංතියේ ආධාර ලබාගැනීම.

(.............)

33) උතුරු හා දකුණු ඇමෙරිකා මහාද්වීප වල බිහි වු ශිෂ්ටාචාර

1) රතු ඉන්දියන්

2) මායා වරු

3) ඉන්කාවරු

4) හොවැංහෝ

5) ඇස්ටෙක්වරු

(.............)

34) එංගලන්තයෙන් කාර්මික විප්ලවය ඇතිවීමට තුඩුදුන් හේතු.

1) අවශ්‍ය ප්‍රග්ධනය තිබීම.

2) අවශ්‍ය ස්වාභාවික සම්පත් තිබීම.

3) අවශ්‍ය ශ්‍රමය තිබීම.

4) අවශ්‍ය වෙළෙඳ පොල තිබීම.

5) ශක්තිමත් ගුවන් හමුදාවක් සිටීම.

(............)

35) දේශ ගවේෂණය

1. වාස්කෝද ගාමා කැලිකට් වෙත යාම.

2. නාවික හෙන්රි නැගෙනහිර ඉන්දියන් දූපත් වලට යාත්‍රා කිරීම.

3. මැගලන් ලොව වටා ගමන් කිරීම.

4. කම්රාල් බ්‍රසිලය වෙත පැමිණීම.

5. වැම්ලෙන් කැනඩාවට පැමිණීම.

(............)

■ පහත දැක්වෙන අංක 36 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙන්නේ පහත වගුවෙ 1, 2, 3, 4, හා 5 යන කවර විග්‍රහය දැයි තෝරා එම අංකය තිත් ඉරමත ලියන්න.

| | පලමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1) | නිවැරදි ය. | වැරදිය. |
| 2) | නිවැරදිය. | නිවැරදිය. |
| 3) | වැරදිය. | වැරදිය. |
| 4) | වැරදිය. | නිවැරදිය. |
| 5) | නිවැරදිය. | නිවැරදිවන අතර පලමු වැන්න මැනවින් විහිදෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 36) | පුනරුදය මෙන්ම ආගමික ප්‍රතිසංස්කරණ ද මධ්‍යගත යුගයෙන් මිදි යාමක් සලකනු කළේය | පුනරුදය මධ්‍යකාලින කලා හා සාහිත්‍ය සම්ප්‍රදායන්ගෙන් බැහැර වූ අතර ආගමික ප්‍රතිසංස්කරණ මධ්‍යගත යුගයේ තිබූ එක්සත්කම අවසන් කළේය. |
| 37) | උත්කෘෂ්ට විප්ලවයට තුඩුදුන් ප්‍රධාන හේතුව වූයේ කාර්මික විප්ලවය යි. | උත්කෘෂ්ට විප්ලවයේ ප්‍රධාන සටන් පාඨය වූයේ නියෝජනයක් නැතිනම් බදුන් නැත යන්න යි. |
| 38) | මුල්කාලින ජාතික රාජ්‍යවල ප්‍රචලිතව පැවැති ආණ්ඩු ක්‍රමය නව රාජාණ්ඩුව ලෙස හඳුන්වනු ලැබේ. | තිස් අවුරුදු යුද්ධයෙන් පසු යුරෝපයේ ආගමික යුද්ධ ඇති නොවීය. |
| 39) | ඇමරිකාවේ ඇති ඉංග්‍රිසි ජනපද ගණන 13 | ඇමරිකාවේ ඇති ජනපද වල ප්‍රංශ පාලනය සිදුවිය. |
| 40) | ඉන්කා හා මායා ශිෂ්ඨාචාර දකුණු ඇමරිකාවේ හා මධ්‍යම ඇමරිකාවේ පිහිටා ඇත. | මෙම ශිෂ්ඨාචාර විනාශ කලේ ස්පාඤ්ඤ දේශ ගවේශකයින් ය. |

# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## පළමු වාර පරීක්ෂණය - 2016
## 12 ශ්‍රේණිය
## ඉතිහාසය

නම :- ........................................................................ අංකය :- ........................... පන්තිය :- ...........

- 1 කොටසේ සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පහත සඳහන් ස්ථානයන් යුරෝපා සිතියමක ලකුණු කර ඉන් දෙකක ඓතිහාසික වැදගත්කම පැහැදිලි කරන්න.

| | | |
|---|---|---|
| 1. ලන්ඩන් | 2. රෝමය | 3. කොන්ස්තන්ති නෝපලය |
| 4. කළු මුහුද | 5. ක්‍රීට් දූපත | 6. සිසිලි දූපත් |
| 7. ඉංග්‍රිසි ඕඩය | 8. කිල් ඇල | |

02. පුරාතන ග්‍රීකයන්ගේ පහත දැක්වෙන අංශවලින් ඕනෑම දෙකක ඔවුන්ගේ කාර්ය සංසිද්ධින් පැහැදිලි කරන්න.


| | | |
|---|---|---|
| 1. ආගම | 2. කලාව හා ගෘහ නිර්මාණ ශිල්ප | 3. සාහිත්‍ය |
| 4. දර්ශනය | | |


03. මධ්‍යයතන යුරෝපය නූතන යුරෝපය බවට පත් කළ සන්ධිස්ථානය පුනරෝදයයි.
   1. වැඩවසම් ක්‍රමයේ ආර්ථික, දේශපාලන, සමාජ ලක්ෂණ දෙක (2) බැගින් නම් කරන්න.
   2. පුනරෝධය යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න.
   3. පුනරෝදයේ දේශපාලන, ආර්ථික, සමාජ වෙනස්වීම් පැහැදිලි කරන්න.

04. 1. යුරෝපයේ ආගමික ප්‍රතිසංස්කරණ ඇතිවීමට තුඩුදුන් ආගමික, ආර්ථික හා සමාජීය සාධක කවරේද ? (ලකුණු 07)
   2. ආගමික ප්‍රතිසංස්කරණයෙන් ඇතිවූ ප්‍රතිඵල පැහැදිලි කරන්න.


05. තිස් අවුරුදු යුද්ධය යුරෝපා ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සලකනු ලැබේ.
   1. යුද්ධය ඇතිවීමට තුඩුදුන් සාධන
   2. යුද්ධයේ ප්‍රධාන අවස්ථා
   3. යුද්ධයේ ප්‍රතඵල

06. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පැහැදිලි කරන්න.
   1. රෝම ශිෂ්ඨාචාරය
   2. ස්ලාම් ශිෂ්ඨාචාරය
   3. දේශ ගවේෂණය
   4. යුරෝපයේ ජාතික රාජ්‍යයන්





# යුරෝපය



1. බෙල්ජියම
2. ස්විස්ටර්ලන්තය
3. ඇල්බේනියාව
4. ඩෙන්මාර්කය
නෝර්වේ
ස්වීඩනය
ෆින්ලන්තය
ජර්මනිය
පෝලන්තය
ප්‍රංශය
පැරිස්
ඔස්ට්‍රියාව
හන්ගේරියාව
රුමේනියාව
බල්ගේරියාව
කළු මුහුද
ස්පාඤ්ඤය
පෘතුගාලය
ඉතාලිය
මධ්‍යධරණී මුහුද